# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව

# 2013

# தேசிய கல்வி ஆணைக்குழு

# வருடாந்த அறிக்கை

# 2013

# National Education Commission

# Annual Report

# 2013

# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

# වාර්ෂික වාර්තාව 2013

## කාර්ය භාරය

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමන්ට නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් 1991 අංක 19 පනතින් පිහිටුවනු ලැබූ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රධාන වශයෙන් ඉටු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම හෝ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීම හැකි කිරීමේ අදහස ඇතිව, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු ම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක ඒ ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට උපදෙස් දීම.

## කොමිෂන් සභාව

පළමුවන කොමිෂන් සභාව 1991-1996 කාලපරිච්ඡේදය සඳහා පත් කරනු ලැබීය. දෙවන කොමිෂන් සභාව 1996 ඔක්තොම්බර් 01 වන දින සිට 2001 සැප්තැම්බර් අවසන් වන තෙක් ක්‍රියාත්මක විය. තෙවන කොමිෂන් සභාව 2001 ඔක්තොම්බර් 01 දින සිට 2004 මැයි 30 දක්වා ක්‍රියාත්මක විය. හතරවන කොමිෂන් සභාව 2004 ජූලි 01 සිට 2006 මාර්තු වන තෙක් ක්‍රියාත්මක විය. පස්වන කොමිෂන් සභාව 2006 අප්‍රේල් 10 සිට සිය කටයුතු ආරම්භ කරන ලද අතර එහි නිල කාලය 2011 වර්ෂයේ අප්‍රේල් 09 දිනෙන් අවසන් විය. හයවන කොමිෂන් සභාව ස්වකීය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2012 නොවැම්බර් 20 දින පවත්වමින් තම නිල කටයුතු ආරම්භ කරන ලදුව මේ වන විට අතිශය ක්‍රියාකාරී ලෙස 1991 අංක 19 පනත අනුව කොමිසම වෙත පැවරී ඇති භූමිකාව හා කාර්ය භාරය ඉටු කරමින් සිටියි.

**කොමිෂන් සභාවේ සංයුතිය සකස් වන්නේ පහත සඳහන් ආකාරයටය :**

(අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඉ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල නිපුණතා දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවේ පූර්ණකාලීන සමාජිකත්වය දරති.

එසේ වුවද, 2004 වර්ෂයේ පටන් එක් උප සභාපතිවරයෙකු විසින් ඉහත උප සභාපති තනතුරු දෙකම (ප්‍රතිපත්ති හා සැලසුම්) ආවරණය කරනු ලබයි.

දැනට මෙම කොමිෂන් සභාව, නුගේගොඩ, නාවල පාරේ අංක: 126 දරන ස්ථානයේ පිහිටා ඇත. ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ ලේකම්, පරිපාලන කටයුතු භාරව ක්‍රියා කරයි. දැනට කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 28 දෙනෙකුගෙන් සමන්විතය. එහි සංවිධාන ව්‍යුහය V ඇමුණුමෙහි දැක්වේ.

# කාර්ය සාධන සාරාංශය - 2013

## (1) හැඳින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත නෛතිකව පැවරී ඇති ප්‍රධාන කාර්ය භාරය පහත සඳහන් පරිදි මූලික භූමිකා තුනක් යටතේ විභේදනය කළ හැකිය.

1. සැලසුම් සමාලෝචන හා විශ්ලේෂණය තුළින් දේශයේ අධ්‍යාපන ප්‍රතිපත්ති විවරණය
2. කාලීන අවශ්‍යතාවයන්ට අනුරූපී වන ලෙස පවත්නා අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා නව්‍යකරණය
3. උක්ත සමාලෝචන, විශ්ලේෂණ, විවරණ, නව්‍යකරණ සියල්ල පසුබිම් කොට ගෙන දේශයට ප්‍රශස්ත අධ්‍යාපන ප්‍රතිපත්ති රාජ්‍ය නායකයාට නිර්දේශ කිරීම.

උක්ත භූමිකාවන් සපුරාලීම පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පහත සඳහන් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර තුන යටතේ ස්ථාවර කමිටු 3ක් ස්ථාපනය කරනු ලැබ තිබේ.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
2. විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
3. තෘතියික හා කාර්මික අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව

එක් එක් ක්ෂේත්‍රයෙහි විශේෂඥ දැනුමක් ඇති ප්‍රවීණයන්, එකී ක්ෂේත්‍රයෙහි හසල අත්දැකීම් ඇති වෘත්තිකයන් සහ අදාළ ක්ෂේත්‍රයේ විවිධ කුසලතා ප්‍රකට කර ඇති පෞද්ගලික අංශයේ විධග්දයන් ප්‍රමුඛ ප්‍රධාන පාර්ශවකරුවන් 15-20 අතර සංඛ්‍යාවකින් මෙම ස්ථාවර කමිටු තුන සමන්විත වේ. 2013 වර්ෂයේ දී මෙම ස්ථාවර කමිටුවල සභාපතිත්වය දරන්නේ පහත සඳහන් විද්වතුන් තිදෙනා ය.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව - ආරියරත්න හේවගේ මහතා
2. විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව - මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මිය
3. තෘතියික හා කාර්මික අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව - මහාචාර්ය දයන්ත විජේසේකර මහතා

රැස්වීම් වාරයක් සඳහා වන නාමික රුපියල් දහසක දීමනාවක් පමණක් ලබමින් මෙම කමිටු සාමාජිකයන් විසින් ජාතික අධ්‍යාන කොමිෂන් සභාවේ කාර්ය භාරය ඉටුකිරීම සඳහා ප්‍රශස්ත කාර්ය භාරයක් 2013 වසරේ ඉටු කර තිබේ. ජාතික අධ්‍යාපන කොමිෂන් සභා සාමාජිකයන්ගේ ද ඉහත දැක්වූ ස්ථාවර කමිටු සාමාජිකයන්ගේ ද විශේෂඥ දැනුම සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ දීර්ඝ කාලීන අත්දැකීම් ද භාවිත කරමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 2013 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්ය සාධනය පහත සඳහන් පරිදි සාරාංශ ගත කළ හැකිය.

## (2) ස්ථාවර කමිටු කාර්ය සාධනය

### 2.1 සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව

සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුව ප්‍රකාශයට පත් කරන ලද්දේ 2003 වර්ෂයේ දී වන බැවින් එම ප්‍රතිපත්ති රාමුව අවධානයට ගනිමින් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනයට අදාළව නව ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. 2013 වර්ෂයේ දී ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදුව ඒ සඳහා ප්‍රථම පියවර ගන්නා ලද්දේ ප්‍රතිපත්ති චක්‍රයක ප්‍රධාන පංච විධ අදියර අනුගමනය කරමිනි. මෙම කාර්යය සඳහා මුල්ම කාර්ය වශයෙන් සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව සක්‍රීයව ස්ථාපනය කරන ලදී. ආරියරත්න හේවගේ මහතා මෙම කමිටුවේ සභාපතිවරයා වශයෙන් තෝරා ගන්නා ලද අතර සාමාන්‍ය අධ්‍යාපනයේ ප්‍රධාන පාර්ශවකරුවන් නියෝජනය කරමින් මුදල් කොමිෂන් සභාව, වෘත්තීය හා තාක්ෂණ විශ්වවිද්‍යාලය, අධ්‍යාපන අමාත්‍යාංශය, කොළඹ විශ්වවිද්‍යාලය, ඌව පළාත් අධ්‍යාපන කාර්යාලය, නව නිපැයුම් කොමිෂන් සභාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, සියනෑ අධ්‍යාපන විද්‍යා පීඨය, ගලේවල සහ ගම්පහ කලාප අධ්‍යාපන කාර්යාල, වේයන්ගොඩ විද්‍යාලෝක විද්‍යාලය, කොළඹ දේවි බාලිකා විද්‍යාලය, ලෝක බැංකු අධ්‍යාපන ව්‍යාපෘතිය යන ආයතන නියෝජනය කරන 18 දෙනෙකුගෙන් සමන්විත වන ලෙස මෙම කමිටුව 2013 වර්ෂය සඳහා ක්‍රියාත්මක වීම ආරම්භ කරන ලදී.

සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ නව ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම සඳහා ස්ථාවර කමිටුව විසින් අනුගමනය කළ යුතු මාර්ග සැලැස්ම (Road Map) සම්පාදනය කිරීම අදාළ ස්ථාවර කමිටුවේ මුල්ම කාර්යය විය. එය පදනම් කරගෙන ප්‍රතිපත්ති රාමු ප්‍රකාශයේ පරිච්ඡේද මාතෘකා අනුපිළිවෙල කෙටුම්පත් කරන ලදී. සාකච්ඡා වට කිහිපයකට පසුව හඳුනා ගන්නා ලද පරිච්ඡේද මාතෘකා අනුපිළිවෙලට අදාළ අවසන් කෙටුම්පත මගින් අවධානය යොමු කළ යුතු විෂය ක්ෂේත්‍ර කවරේද යන්න තීරණය කෙරිණි.

භාෂාත්‍රයෙන්ම පුවත්පත් දැන්වීම් පල කොට විවිධ පාර්ශවකරුවන්ගේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා නිර්මාණය කෙරෙන නව ප්‍රතිපත්ති රාමුවක් සඳහා අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා ක්‍රියා කරන ලදී.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ද තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ද අනුග්‍රහය ලබාගෙන ප්‍රවෘත්ති සාකච්ඡා මාලාවක් පවත්වා මේ පිළිබඳ යොමු කරවන ලද අවධානය හේතුකොට ගෙන විවිධ පාර්ශවකරුවන් හා ඇලුම් කණ්ඩායම් වෙතින් මෙම කාර්යය සඳහා සාධනීය ප්‍රතිචාර ලබාගත හැකිවිය. විශේෂ අවධානය යොමු කළ යුතු ඇලුම් කණ්ඩායම් කැඳවා විවෘත සාකච්ඡා පවත්වමින් සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු විවිධ අංශ සහ විෂය ක්ෂේත්‍ර අනාවරණය කරගත හැකි විය.

මෙහිදී අනාවරණය වූ කරුණු අනුව විෂය ක්ෂේත්‍ර 10ක් යටතේ අධ්‍යයන සිදු කර ප්‍රතිපත්ති රාමුව සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු බව තීරණය විය. එක් එක් විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කර වාර්තාවක් බැගින් ඉදිරිපත් කිරීම සඳහා විෂය ප්‍රවීණයන් 3-4 දෙනෙකු බැගින් එක් එක් ක්ෂේත්‍රය සඳහා තෝරා ගන්නා ලදී. තීරණය කරන ලද විෂය ක්ෂේත්‍ර 10 පහත සඳහන් පරිදි වේ.

1 විෂයමාලා සංවර්ධනය
2 ගුරුවරුන්ගේ සහ ගුරු අධ්‍යාපනඥයින්ගේ වෘත්තීය සංවර්ධනය
3 තක්සේරුකරණය හා ඇගයීම
4 ගුණාත්මකභාවය සහතික කිරීම සහ ප්‍රතීතකරණය
5 අධ්‍යාපන සැලසුම්කරණය හා කළමනාකරණය
6 ඉගෙනුම් පරිසරය සංවර්ධනය කිරීම
7 අධ්‍යාපන ආයෝජනය
8 වෘත්තීය මාර්ගෝපදේශය
9 ඉගැන්වීම් මාධ්‍ය, ජාතික හා ජාත්‍යන්තර භාෂා
10 විශේෂ අධ්‍යාපන හා නොවිධිමත් අධ්‍යාපනය

පුවත්පත් දැන්වීම් පළකිරීමට අමතරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වෙබ් අඩවිය මගින් මේ පිළිබඳ මහජන අදහස් හා යෝජනා කැඳවීම පිළිබඳ පුවත ප්‍රකාශයට පත් කරන ලදී.

අධ්‍යයන කණ්ඩායම් දහය සඳහා (TOR) කාර්ය නිශ්චය පත්‍රිකා ලබා දී 2013 වර්ෂාවසානය වන විට ඔව්හු ස්වකීය ප්‍රතිපත්ති යෝජනා අධ්‍යයනයන්ට අදාළ ක්ෂේත්‍ර චාරිකාවන්හි නිරතව සිටිති.

### 2.2 විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව

මෙම ස්ථාවර කමිටුව ද විවිධ වෘත්තීය හා අධ්‍යයන පාර්ශවකාර සහ ඇලුම් කණ්ඩායම්වල සහභාගීත්වයෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති රාමුවක් සකස්කිරීමේ අවසාන ඉලක්කය දක්වා ගමන් කිරීමේ අපේක්ෂාවෙන් කමිටු රැස්වීම් රැසක් පවත්වන ලදී. විශ්වවිද්‍යාල අධ්‍යාපනයට අදාළ ජාතික ප්‍රතිපත්ති සැකසීමේ දී පහත දැක්වෙන කරුණු කෙරෙහි දැඩි අවධානයක් යොමු විය යුතු බව මේවායේ දී අවධාරණය කෙරිණි.

1 විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ජාතික ප්‍රතිපත්තියක අවශ්‍යතාව.
2 "මහින්ද චින්තන" ඉදිරි දැක්මෙහි විශේෂයෙන් සඳහන්ව ඇති පරිදි මව් භාෂාවෙන් අධ්‍යාපනය ලබා දීම.
3 විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා වන ජාතික ගුණාත්මක තහවුරුව හා බලාත්මක කිරීම පිණිස සභාවක් ස්ථාපනය කිරීම.
4 විශ්වවිද්‍යාල ප්‍රවේශ ප්‍රතිපත්තිය ප්‍රතිසමාලෝචනයට ලක් කිරීම.
5 විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ශිෂ්‍ය, ගුරු, විදුහල්පති ප්‍රජාවන්ට මාර්ගෝපදේශ ලබා දීම.

6 රාජ්‍ය විශ්වවිද්‍යාලයන්ට අනුබද්ධිතව ප්‍රාදේශීය මට්ටමෙන් විශ්වවිද්‍යාල පාඨශාලා (University Colleges) ඇති කිරීම.

7 උසස් අධ්‍යාපනය සඳහා බහු විධ අධ්‍යයන පද්ධති ඇති කිරීම.

8 අනුබද්ධිත උපාධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

9 රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා ආංශික ප්‍රවේශ ස්ථාපනය.

10 පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ජාතික ගුණාත්මක රාමුවක් හඳුන්වා දීම.

11 විශ්වවිද්‍යාලයන්හි විනය පවත්වාගෙන යාම සඳහා පොදු මාර්ගෝපදේශ සැකසීම.

12 විශ්වවිද්‍යාලයන්හි ශිෂ්‍ය අසහනය කෙරෙහි අවධානය යොමු කිරීම.

13 වෛද්‍ය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි අධ්‍යාපනය.

14 ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන හා රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා අනුගමනය කළ යුතු විනය පිළිබඳ මහජන මතය ලබා ගැනීම.

මෙම කමිටු රැස්වීම්වලට සමගාමීව ජාතික අධ්‍යාපන කොමිෂන් සභා සාමාජිකයන් කිහිපදෙනෙකු ද, ස්ථාවර කමිටු සාමාජිකයන් කිහිප දෙනෙකු ද, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති, උප සභාපති සහ ලේකම් ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් කිහිප දෙනෙකු ද බැගින් සහභාගී වන ක්ෂේත්‍ර චාරිකා කිහිපයක් මගින් බිම් මට්ටමේ පාර්ශවකරුවන් සහ ඇලුම් කණ්ඩායම් සමග ඍජු සංදේශන ක්‍රමවේදය භාවිත කෙරෙන සකච්ඡා වට කිහිපයක් සංවිධානය කෙරිණි. පහත සඳහන් ආයතනවල අධ්‍යයන කාර්ය මණ්ඩල, අනධ්‍යයන කාර්ය මණ්ඩල, පරිපාලන කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් යන උපකුලක නියෝජනය කෙරෙන කණ්ඩායම් සමග ව්‍යුහගත සාකච්ඡා පැවැත්වීම මෙහිදී භාවිත කෙරුණු ක්‍රමවේදය විය. පහත දැක්වෙන විශ්වවිද්‍යාල වලට ගොස් භෞතික නිරීක්ෂණයේ යෙදෙමින් මෙම සාකච්ඡා පැවැත්වීම එහිදී සංවිධානය කෙරිණි.

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2. මොරටුව විශ්වවිද්‍යාලය
3. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පහත දැක්වෙන කරුණු කෙරෙහි ද විශේෂ අවධානය යොමුවිය යුතු බව මෙම සාකච්ඡා මාලාවේදී අනාවරණ විය.

1. අධ්‍යයන, අනධ්‍යයන, සහායක කාර්ය මණ්ඩලවල සංඛ්‍යාත්මක ඌනතා
2. අනධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩල සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් නොමැති වීම.
3. සුදුසුකම් සපුරන විශේෂඥ කාර්ය මණ්ඩලවල ඌනතා

**2.3 තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව**

මෙම කමිටුවට ද අදාල ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත සාමාජික මණ්ඩලයක් පත් කරන ලදි. මෙම ස්ථාවර කමිටුවේ සාමාජිකයන් විසින් තෘතික හා වෘත්තීය අධ්‍යාපනයට අදාල ජාතික ප්‍රතිපත්ති

රාමුවක් සකස් කිරීම සඳහා මාර්ග සැලැස්මක් පිළිබඳ සාකච්ජා කරන ලදී. මෙම මාර්ග සැලැස්ම සකස් කිරීමේදි පහත දැක්වෙන කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම සුදුසු බව තීරණය කෙරෙණි.

- **තෘතියික අධ්‍යාපන සංකල්පය**
- **තෘතියික හා වෘත්තීය අධ්‍යාපනයේ විවිධත්වය**
- **තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව යන ක්ෂේත්‍රයන්හි අතිපිහිත වීම් සහ පරතරයන්**
- **වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය**
- **දේශීය තත්ත්ව සහතික ආයතන ඔස්සේ ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන්වල ගුණාත්මකභාවය**
- **සාමාන්‍ය, උසස්, වෘත්තීය හා තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයන් අතර පවත්නා අන්‍යොන්‍ය සහ-සම්බන්ධතා**
- **වෘත්තීය, ආයතන, ජාත්‍යන්තර සුදුසුකම් පිරිනමන ආයතන, ජාත්‍යන්තර තත්ත්ව සහතික පිරිනමන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි පුහුණු කටයුතු, බඳවා ගැනීමේ ආයතන**

**(3) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පැවරුණු විශේෂ කාර්යයන්**

**3.1 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා අධ්‍යයන වාර්තා ලබා දීම**

අමාත්‍ය මණ්ඩල ලේකම්තුමා සහ ජනාධිපති ලේකම්තුමා විසින් පහත සඳහන් කරුණුවලට අදාළව නිර්දේශ ඉල්ලා සිටින ලදුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් අවශ්‍ය උප කමිටු පත් කරමින් සුදුසු අධ්‍යයන සිදු කොට නියමිත වාර්තා සම්පාදනය කරන ලදී.

**3.1.1. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල සම්බන්ධ ජාතික මට්ටමේ සම්මන්ත්‍රණය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ ඇතුළත් යෝජනාවලිය අඩංගු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අදාළ කරුණු පිළිබඳ අධ්‍යයනය කර වාර්තා කිරීම.**

ජනාධිපති ලේකම්තුමා විසින් ඉහත කී යෝජනාවලිය, අධ්‍යයනය කර වාර්තා කරනු පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී. ඒ අනුව මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා, ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා සහ මහාචාර්ය ජයසේන කෝට්ටෙගොඩ මහතා යන ත්‍රිපුද්ගල කොමිෂන් සභා සාමාජික කමිටුව විසින් මෙම යෝජනාවලිය අධ්‍යයනය කර ඉදිරිපත් කෙරුණු වාර්තාව පදනම් කරගෙන අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**3.1.2 උගත් පාඩම් සහ ප්‍රතිසංවිධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම-ජනවාර්ගික මිශ්‍ර පාසල් පිහිටුවීම සඳහා දිරිගැන්වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ ඇතුළත්**

**යෝජනාවලිය සම්බන්ධයෙන් අඩංගු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අදාළ කරුණු පිළිබඳ අධ්‍යයනය කර වාර්තා කිරීම.**

ජනාධිපති ලේකම්තුමා විසින් ඉහත කී යෝජනාවලිය අධ්‍යයනය කර වාර්තා කරනු පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් උක්ත යෝජනාවලිය අධ්‍යයනය කර ජනාධිපති ලේකම්තුමා වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**3.1.3 ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල ක්‍රියාකාරිත්වයට අදාළ පහත දැක්වෙන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවලට අදාළ කරුණු පිළිබඳ අධ්‍යයනය කර වාර්තා කිරීම.**

A) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල ඉගෙනුම ලබන අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාවේ පසු වන සිසු දරුවන්ට මව්බස, ආගම හා ඉතිහාසය යන විෂයයන් ඉගැන්වීම අනිවාර්ය කිරීම.

B) රජයේ අනුමත ආධාර නොලබන පෞද්ගලික පාසලක් සඳහා රජයේ අනුමත ආධාර ලබන පෞද්ගලික පාසල්වලට ලබාදෙන පහසුකම් ලබා දීම.

C) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම.

ජනාධිපති ලේකම්තුමා විසින් ඉහත කී අමාත්‍ය මණ්ඩල පත්‍රිකා තුන ඒවාට අදාළ යෝජනාවලින් අධ්‍යයනය කර වාර්තා කරනු පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී. ඒ අනුව ඉහත A යෝජනාවලිය අධ්‍යයනය කර වාර්තා කිරීම සඳහා මහාචාර්ය එස්. සන්දසේගරම් මහතා, වෛද්‍ය හිරන්ති විජේමාන්න මිය සහ පුෂ්පා කලුබෝවිල මිය යන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා සාමාජික සාමාජිකාවන්ගෙන් සමන්විත අනුකමිටුවක් පත් කරන ලදී.

අනතුරුව එකී අනු කමිටු වාර්තාව ද පදනම් කරගෙන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකා තුනටම අදාළ අවසන් නිර්දේශ ජනාධිපති ලේකම්තුමා වෙත ඉදිරිපත් කරන ලදී.

**3.2 ජනාධිපති ලේකම් කාර්යාලය වෙත සම්පාදනය කෙරුණු වාර්තා**

ඉහත දැක්වුණු කාර්ය භාරයට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලය වෙතින් ද, අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලය වෙතින් ද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් විශේෂයෙන් අධ්‍යයනය කර වාර්තා කළ යුතු රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අදාළ කාර්ය භාරයක් ද වරින් වර පැවරිණි.

ඒ අතරින් 'රාජ්‍ය නිලධාරීන් විසින් අත්කරගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පිළිබඳ ව කරුණු අධ්‍යයනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද නිලධාරී කමිටුවේ වාර්තාවට' අදාළ අධ්‍යයනය ප්‍රමුඛ වෙයි. මේ අනුව මව් බසට අතිරේකව අනෙක් රාජ්‍ය

භාෂාව ද දෙවන බස මට්ටමින් අනිවාර්ය විෂයක් ලෙස 2017 වර්ෂයේ සිට අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා ඇතුළත් කිරීමේ යෝග්‍යතාව අදාළ සියලු පාර්ශවයන් විමසා බලා නිර්දේශ සහිත වාර්තාවක් ස-මසක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස දන්වා ජනාධිපති ලේකම්තුමා විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත යොමු කර තිබේ. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මේ වන විට එකී අධ්‍යයනයට අදාළ සමීක්ෂණ හා විශ්ලේෂණ කටයුතුවල නිරතව සිටී.

**(4) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ විශේෂ අධ්‍යයන**

**4.1 3වන වර්ගයේ පාසල්වල තොරතුරු අඩංගු දත්ත පාදයක් සකස් කිරීම.**

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් කරනු ලැබූ පාසල් වර්ගීකරණයට අනුව කුඩා පාසල් බහුතරයක් අයත් වන්නේ 2 වර්ගය හා 3 වර්ගයේ පාසල් කාණ්ඩයන්ටය. 2012 වනවිට 2 හා 3 වර්ගයේ පාසල් සංඛ්‍යාව 7139කි. තවද, මෙම පාසල් විශාල ප්‍රමාණයක් ග්‍රාමීය, වතුකර හා අර්ධ නාගරික ප්‍රදේශ වල ස්ථාන ගත වී ඇත. මේ අතරින් 3වන වර්ගය යටතේ සැලකෙන පාසල්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මක කාර්ය සාධනය පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම ඔස්සේ අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට පහසුවක් සැලසෙන බව අනාවරණය වී ඇත. එබැවින් ශ්‍රීලංකාවේ දැනට ක්‍රියාත්මක වන සියලුම 3වන වර්ගයේ පාසල්වලට අදාළ ව දත්ත සම්පාදනය කිරීම ආරම්භ කිරීම 2013 වසරේ දී සිදු විය.

ඒ සඳහා ප්‍රශ්නාවලි සකස් කොට 130ක් වන ගුරු උපදේශකවරුන්ගේ සහාය ලබාගෙන තොරතුරු සම්පාදනය කිරීම සැලසුම් කළ ක්‍රමවේදය විය. පාසල් කිහිපයක් තෝරාගෙන සිදු කළ නියමු නියැදි අභ්‍යාසයකින් පසුව බස්නාහිර පළාතේ 374 ක් වන සියලුම 3වන වර්ගයේ පාසල් වෙතින් මෙම තොරතුරු රැස් කරන ලදී. 2013 වසර අවසාන වන විට එම තොරතුරු දත්ත පාදයකට සුදුසු පරිදි විශ්ලේෂණය කරමින් තිබේ.

## කාර්ය සාධනය ඉහල නැංවීමේ යෝජනා

### 1. කාලීන ආයතනික සැලසුම්

#### 1.1 දැක්ම සහ මෙහෙවර

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මේ වන විට භාවිත කරන්නේ 1991 වසරේ මෙම කොමිෂන් සභාව පිහිටුවීම සඳහා හේතු පාදක වූ අංක 1991 අංක 19 දරන පනතේ සඳහන් විධි විධානයන්ට සීමා වූ දැක්මක් සහ මෙහෙවර ප්‍රකාශයකි. එසේ වුව ද ගෝලීය වශයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මේ වන විට සිදු වෙමින් පවත්නා වෙනස්කම් හා ප්‍රවනතාවන් හඳුනා ගනිමින් ප්‍රධාන රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශය වන මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි සඳහන් දැනුම් කේන්ද්‍රීය සමාජයක් නිර්මාණය කිරීමෙහි ලා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දැක්ම සහ මෙහෙවර යළි විවරණය විය යුතුව තිබේ.

#### 1.2 ආයතනික අගයන් සහ අභිමතාර්ථ

වෙනස් වන නව දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ආයතනික අගයන් හඳුනාගත යුතුව ඇති අතර අභිමතාර්ථයන් වැඩි දියුණු විය යුතුව තිබේ. ඒ සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභා සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් විද්වත් වැඩමුළුවක් පැවැත්වීමට සැලසුම් සකස් කරමින් තිබේ.

### 2. සම්පත් සම්පාදනය

#### 2.1 මූල්‍ය සම්පත්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා 2014 වර්ෂය සඳහා වඩාත් නිශ්චිත ව්‍යාපෘති යෝජනා සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා මේ වන විට ඉදිරි ක්‍රියා මාර්ග ගැනෙමින් පවතියි.

#### 2.2 මානව සම්පත්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය මේවන විට 28 දෙදෙකුට සීමා වී ඇත. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පර්යේෂණ හා සමීක්ෂණ අනිවාර්ය සහ අත්‍යවශ්‍ය වන බැවින් එම කාර්යයන් සඳහා නිපුණතා සහිත කාර්ය මණ්ඩලයක් සිටීම වැදගත් වේ. ඒ සඳහා නව තනතුරු ඇති කිරීමට ද පවත්නා සීමිත පුරප්පාඩු සියල්ල පිරවීමට ද මේ වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනෙමින් පවතිය. ඊට අමතරව සමස්ත කාර්ය මණ්ඩලයට සුසුදු රැකියා විස්තර සම්පාදනය ද මේ වන විට සිදු වෙමින් තිබේ.

## පරිපාලනය පිළිබඳ වාර්තාව

### 1. කොමිෂන් සභාව

(අ) 2013 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති වශයෙන් මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා ක්‍රියා කළේය.

(ආ) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා 2013 වර්ෂයේදී උප සභාපති වශයෙන් ආචාර්ය ජයන්ති ගුණසේකර මහත්මිය ජනාධිපතිතුමා විසින් පත් කරන ලදී.

(ඇ) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් 2013.04.01 දින දක්වා චන්ද්‍රරත්න පල්ලේගම මහතා ද, 2013.04.01 දින සිට මේ දක්වා පී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ මහත්මිය ද ගරු ජනාධිපතිතුමා විසින් පත්කරන ලදුව ක්‍රියා කළෝය.

### 2. බාහිර ආධාර ලබන ව්‍යාපෘති

බාහිර ආධාර ලබාගෙන ක්‍රියාත්මක වූ වැඩසටහන් කිසිවක් 2013 වර්ෂයේ දී ක්‍රියාත්මක නොවීය. එසේ වුව ද සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වන ප්‍රතිපත්ති සකස් කිරීමට අදාළව ආරම්භ කෙරුණු ප්‍රතිපත්ති චක්‍රය ක්‍රියාත්මක කිරීමේ දී පාර්ශවකාර සහ ඇලුම් කණ්ඩායම් හඳුනාගැනීමේ සිට දස විධ අධ්‍යයනයන් සඳහා යොමු වීම දක්වා පියවරවල දී ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය හරහා කෙරුණු ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය අනුග්‍රහය සපයන ලද්දේ ලෝක බැංකුවේ දැනුම් කේන්ද්‍රයක් සඳහා පාදකවන්නා වූ පාසල් අධ්‍යාපන පද්ධතියක් ඇති කිරීම සඳහා වූ ව්‍යාපෘතිය මගිනි. මේ සඳහා වැය කෙරුණු මුදල රු. මිලියන 5 ක් පමණ විය.

ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව - 2013

**වියදම් ශීර්ෂ අංකය : 12**

**අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

| වැය විෂය සහ වත්කම් කාණ්ඩය | | වත්කම් සංකේතය සහ නම | | වර්ෂය තුළ එකතුකිරීම් *** | |
|---|---|---|---|---|---|
| | | | | රු. | |
| | | BAI | යතුරු පැදිය | 1 | 152,040.00 |
| | | SC | වානේ අල්මාරි | 6 | 80,700.00 |
| | | C3 | අමුත්තන් සඳහා වූ වානේ පුටු | 13 | 61,600.00 |
| | | BA | වීදුරු පොත් අල්මාරි | 1 | 20,000.00 |
| | | COM-LTC | ලැප්ටොප් පරිගනක | 3 | 386,500.00 |
| | | PSC | ස්කෑනර් යන්ත්‍ර | 1 | 13,250.00 |
| | | T25 | L හැඩැති විධායක මේස | 2 | 99,800.00 |
| | | T26 | වානේ ලිපිකරු මේස 50"*30" | 3 | 37,350.00 |
| | | C15 | ලිපිකරු පුටු | 3 | 13,500.00 |
| | | FC | ලිපිගොනු කැබිනට් - වානේ | 1 | 14,900.00 |
| | | EK | විදුලි කේතල | 1 | 3,900.00 |
| | | CHB | ෆ්ලිප් චාර්ට් බෝඩ් | 3 | 33,566.40 |
| | | DT | ඩේටා ට්‍රැවලර් | 3 | 6,670.00 |
| | | COM-KB | පරිගනක යතුරු පුවරු | 1 | 1,250.00 |
| | | PC | ඡායා පිටපත් යන්ත්‍ර | 1 | 291,200.00 |
| | | | | | **1,216,226.40** |

ඇමුණුම් II

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

සත්‍ය වියදම - 2013

| වැය ශීර්ෂ අංකය | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
|---|---|---|---|
| | **<u>පුනරාවර්තන වියදම්</u>** | **27,003,800.00** | **25,244,406.97** |
| | <u>වැටුප</u> | | |
| 1001 | වැටුප් හා වේතන | 9,440,000.00 | 8,442,011.49 |
| 1002 | අතිකාල හා වෙනත් දීමනා | 660,000.00 | 658,971.30 |
| 1003 | වෙනත් දීමනා | 4,900,000.00 | 4,336,401.71 |
| | <u>ගමන් වියදම්</u> | | |
| 1101 | දේශීය | 100,000.00 | 99,889.00 |
| 1102 | විදේශීය | | |
| | <u>සැපයීම්</u> | | |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 250,000.00 | 246,931.01 |
| 1202 | ඉන්ධන හා ලිහිසි තෙල් | 1,700,000.00 | 1,661,513.04 |
| 1203 | නිල ඇඳුම් | 91,191.00 | 89,541.00 |
| 1205 | වෙනත් | 75,000.00 | 74,239.98 |
| | <u>නඩත්තු වියදම්</u> | | |
| 1301 | වාහන | 900,000.00 | 892,363.32 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 500,000.00 | 455,561.23 |
| 1303 | ගොඩනැගිලි | 75,000.00 | 23,510.00 |
| | <u>ශිවිසුම්ගත සේවා</u> | | |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 600,000.00 | 588,955.05 |
| 1403 | විදුලිය හා ජලය | 900,000.00 | 874,279.44 |
| 1404 | බදු කුලිය | 5,268,800.00 | 5,265,321.60 |
| 1405 | වෙනත් | 1,543,809.00 | 1,534,917.80 |
| | | | |
| | **<u>මූලධන වියදම්</u>** | **4,050,000.00** | **2,618,596.44** |
| | | | |
| | <u>මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම</u> | | |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 50,000.00 | -- |
| | <u>මූලධන වත්කම් අත්පත් කරගැනීම</u> | | |
| 2101 | වාහන | 200,000.00 | 152,040.00 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 900,000.00 | 772,986.40 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 400,000.00 | 291,200.00 |
| | | | |
| 2401 | පුහුණුව හා සංවර්ධනය | 500,000.00 | 498,000.00 |
| | <u>වෙනත් මූලධන වියදම්</u> | | |
| 2502 | ආයෝජනය | 2,000,000.00 | 904,370.04 |
| | එකතුව | **31,053,800.00** | **27,863,003.41** |

ඩී.පී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2013

වියදම් ශීර්ෂ අංකය:12 අමාත්‍යංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ නම : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | (3) මු:රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාළ ඩී.පී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | පුනරාවර්තන | 26,075,000 | 928,800 | 2,116,191<br>-2,116,191 | 27,003,800 | 25,244,407 | 1,759,393 | 3 |
| | උප එකතුව (පුනරාවර්තන) | 26,075,000 | 928,800 | -- | 27,003,800 | 25,244,407 | 1,759,393 | |
| 1 | මූලධන | 3,350,000 | 700,000 | -- | 4,050,000 | 2,618,596 | 1,431,404 | 4 |
| | උප එකතුව (මූලධන) | 3,350,000 | 700,000 | -- | 4,050,000 | 2,618,596 | 1,431,404 | |
| | මුළු එකතුව | 29,425,000 | 1,628,800 | -- | 31,053,800 | 27,863,003 | 3,190,797 | |

පිටු අංක 2 සිට 15 දක්වා ඩී.පී.එස්.ඒ 2 සිට ඩී.පී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක 16 සිට 20 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස්.වේ . එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාල ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිළධාරි
නම :
තනතුර :
දිනය : 31 මාර්තු 2014
ආචාර්ය ලක්ෂ්මන් ජයතිලක
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.

ගණන්දීමේ නිළධාරි
නම :
තනතුර :
දිනය :
පී. ජී. ඩී. [illegible] පේරසිංහ
ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 14.03.31
එස්. එම්. ආරියරත්න ද අල්විස්
නියෝජ්‍ය ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.

පරීක්ෂා කරන ලදී.
විගණන නිරීක්ෂණ අමුණා ඇත.
එච්. එම්. ගුණරත්න
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.
දිනය: 2014.06.27

ඇමුණුම IV

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව**

**2013 වර්ෂය**

හයවන කොමිෂන් සභාව ස්වකීය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2012 නොවැම්බර් 20 දින පවත්වමින් තම නිල කටයුතු ආරම්භ කරන ලදී.

**එහි සාමාජිකත්වය :**

**සභාපති** : මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා

උප සභාපති : ආචාර්ය ජයන්ති ගුණසේකර මිය

**නිල බලයෙන් පත්වන සාමාජිකයන් :**

| | |
|---|---|
| සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | මහාචාර්ය ගාමිණී සමරනායක මහතා 2013.01.15 වන විට<br>මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මිය 2013.02.19 සිට |
| සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | මහාචාර්ය දයන්ත විජේසේකර මහතා |
| අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්) | ගෝඨාභය ජයරත්න මහතා 2013.07.30 වන විට<br>අනුර දිසානායක මහතා 2013.09.17 සිට |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිත (අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව) | අයන්ති ද සිල්වා මිය |
| පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්) | ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා |

**පත්කරන ලද සාමාජිකයින් :**

පූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන්වහන්සේ

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා

ආරියරත්න හේවගේ මහතා

පුෂ්පා කළුබෝවිල මිය

මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතා

මහාචාර්ය එස්. සන්දසේගරම් මහතා

ආචාර්ය හිරන්ති විජේමාන්න මිය

අනෝජා විජේසේකර මිය

**ලේකම්**

චන්ද්‍රරත්න පල්ලේගම මහතා - 2013.04.01 දක්වා

පී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ මිය - 2013.04.01 සිට

**ශීර්ෂ 1 සිට 22 දක්වා විශේෂ වියදම් ඒකක පිළිබඳ 2014.10.29 දින ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ලැබුණු 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තා කෙටුම්පතෙන් උපුටා ගන්නා ලද සටහනකි**

---

## I කොටස

**විශේෂ වියදම් ඒකක ශීර්ෂ හා අදාළ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. විශේෂ වියදම් ඒකක ශීර්ෂ හා දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභාව**

| ශීර්ෂ | දෙපාර්තමේන්තුව, කාර්යාලය හා කොමිෂන් සභාවේ නම |
|---|---|
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු 31,053,800 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු 27,863,003 ක් උපයොජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාවේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු 3,190,797 ක් හෙවත් සියයට 10 ක් ඉතිරි වී තිබූ අතර එහි පරාසය සියයට 12 ත් සියයට 100 ත් අතර පැවතුණි. විස්තර පහත දැක්වේ.

**2013 දෙසැම්බර් 31 දිනට**

| වියදම | ශුද්ධ ප්‍රතිපාදන | උපයෝජනය | ඉතිරිය | ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 27,003,800 | 25,244,407 | 1,759,393 | 6.5 |
| මූලධන | 4,050,000 | 2,618,596 | 1,431,404 | 35.3 |
| එකතුව | 31,053,800 | 27,863,003 | 3,190,797 | |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව වෙනුවෙන් පනවා තිබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **01201** | **1,500,000** | **759,659** | **600,000** | **858,611** | **6,000,000** | **2,648,335** |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### 2.3.1 අග්‍රිම ගිණුම

අග්‍රිම ගිණුම් අංක 7002/0000/00/0256/0013/000 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු 994,887 ක් විය.

### 2.3.2 පොදු තැන්පත් ගිණුම්

පොදු තැන්පත් ගිණුම් අංක 6000/0/15/14 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 30,000 ක් විය.

## II කොටස

### එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

### 1 ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

### 1.1 විගණන විෂය පථය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වු විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 11 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පෘථුල විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ වගකීම

විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රක සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන නිරීක්ෂණ

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති නිරීක්ෂණය විය.

| විමසුම | පිළිතුර |
|---|---|
| **(අ)** ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>--------------------------------------------<br>යාවත්කාලීනව නොතිබූ ලේඛන — අදාළ රෙගුලාසි<br>----------------- ----------------------------<br>ස්ථාවර වත්කම් ලේඛනය — 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය සහ 1998 අගෝස්තු 04 දිනැති අංක 354 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය සහ 2009 ඔක්තෝබර් 11 දිනැති අංක ඩී හා ඒ/2009/2 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය.<br><br>පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ලේඛනය — 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | **(අ)** 2013.07.12 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛනයේ ප්‍රකාර කොමිෂන් සභාවේ වත්කම් මේ වන විට ලේඛන ගත කර ඇත. ඒ සමඟ ම ස්ථාවර වත්කම් ලේඛනය ද යාවත්කාලීන කර ඇත.(යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයේ පිටපතක් ඇමුණුම 1ලෙස ඉදිරිපත් කරන ලදී). |
| **(ආ) අයවැය විචලනය**<br>------------------<br>(I) වැය විෂයයන් 01 සඳහා සලසා තිබුණු රු 50,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.<br>(II) වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම සහ සැලසුම් කළ ක්‍රියාවලින් ක්‍රියාත්මක නොවීම යන හේතූන් නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු 1,430,894 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ත් සියයට 69 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි. | **(ආ)** යන්ත්‍රෝපකරණ වැඩිදියුණු කිරීමක් සිදු නොවූ හෙයිනුත්, ඇතැම් අපේක්ෂිත වියදම් සඳහා අවශ්‍ය අවස්ථා වල දී භාණ්ඩාගාරයෙන් අක් මුදල් නොලැබුණු බැවිනුත්, එකී කාලසීමාව තුල වියදම් නොවුණි.<br><br>පුනරාවර්තන වැය විෂයන්ගෙන් හා මූලධන වැය විෂයයන් යටතේ මුළු ඇස්තමේන්තු ගත මුදලින් 90% (විසර්ජන ගිණුම D.G.S: A: 5) වියදම් කර ඇත. පැවති ප්‍රායෝගික තත්ත්වයටතේ මෙම වියදම ඉක්මවා යාමට අවකාශ නොවීය. |
| **(ඇ) අග්‍රිම ගිණුම්**<br>------------<br>(I) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරක දී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය භාණ්ඩාගාර අනුමැතියෙන් 50,000 දක්වා වැඩි කරගෙන තිබුණු නමුත් එම සීමාවද ඉක්මවා නිලධාරින් 04 දෙනෙකුට අවස්ථා 16 කදී රු 50,000 සිට රු 130,000 අතර මුළු වටිනාකම රු. 998,500 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.<br><br>කොමිෂන් සභාවේ රැස්වීම් හා වැඩමුළු ආදිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 21 කදී ලබාදුන් රු. 638,000 ක් වූ අත්තිකාරම් මුදල් වලින් රු. 239,000 ක් හෙවත් 37% ක් වැය නොකර නැවත පියවා තිබුණි. එසේම අත්තිකාරම් ලබාගත් කාර්යයෙන් බැහැරව වැය කිරීමද, ඇස්තමේන්තුවලින් තොරව අත්තිකාරම් ලබාදීමද, එකම කාර්යය සඳහා ලබාගත් අත්තිකාරම් මුදල් පියවීමට පෙර තවත් අත්තිකාරම් මුදලක් ලබාදීමද යන කරුණුද නිරීක්ෂණය විය. | **(අ)** කොමිෂන් සභාවේ තත්කාර්ය අග්‍රිමය රු 50,000 සීමාවේ පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය දී තිබිණි. වසරේ අවසන් මාස කිහිපය තුළ අක්මුදල් ලැබීමේ අනුපාතයට සාපේක්ෂව වැඩ සටහන් සැලසුම් සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමේදී අත්‍යාවශ්‍ය කාරණා සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය යටතේ මෙසේ මුදල් භාවිතා කිරීමට සිදු වී ඇත. කාර්යසාධනය ඉටු වී ඇති අතර රජයට මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැත.<br><br>**(ආ)** අත්තිකාරම් මුදලින් 37% ක් ඉතිරි වීමට ප්‍රධාන හේතුව කමිටු සාමාජිකයන් රැස්වීමට සහභාගී නොවීමයි. කමිටු රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ සහභාගීත්වය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පාලනයෙන් බැහැර කටයුත්තකි. |

| | |
|---|---|
| | නිලධාරීන්ගේ හිඟය නිසා එකම නිලධාරියෙකු ව්‍යාපෘති කිහිපයක මුදල් ගෙවීම සඳහා එක් සතියක් තුළ ප්‍රදේශ තුනකට යැවීම නිසා අත්තිකාරම් පියවීම ප්‍රමාද වී තිබේ. රජයට කිසිදු මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැත. සියළු අත්තිකාරම් ලබා දී ඇත්තේ කලින් අනුමත කරන ලද ව්‍යාපෘති සැලසුම් අනුවය.<br><br>ඉහත (අ) (ආ) තත්ත්ව මතු ඇති නොවනු පිණිස තත්කාර්ය අග්‍රිම සීමාව රු 100,000 දක්වා වැඩි කරන ලෙස මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටින ලදුව මේ වන විට තත්කාර්ය අග්‍රිම සීමාව සඳහා අනුමැතිය රු. 75,000.00 දක්වා ලබා දී ඇත. |
| **1.4 යහ පාලනය සහ ගිණුම් කටයුතුභාවය**<br>---------------------------------------- | |
| **1.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**<br>2013 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබූ අතර එම සැලස්මෙහි ඒ ඒ කාර්යභාරයන් ඉටුකළ යුතු කාලය හෝ කාලපරාසයද, ඇස්තමේන්තුගත පිරිවැය හා එක් එක් කාර්යයන් සඳහා වගකිව යුතු නිලධාරීන්ද සඳහන් කර නොතිබුණි. | ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වඩාත් විස්තරාත්මකව සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **1.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**<br>ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් වෙන්කර තිබූ රු. 850,000 ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර රු. 805,256ක ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ භාණ්ඩ මිලදී ගෙන තිබූ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ)ඡේදය අනුව ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි. | ඇස්තමේන්තු සකස් කරනවිට පැරණි කොමිෂන් සභාව අක්‍රිය තත්ත්වයේ පැවතිණි. නව කොමිෂන් සභාව නියමිත පරිදි ක්‍රියාත්මකවීම ආරම්භ වූ පසු රැස්වීම් හා ව්‍යාපෘති සඳහා හදිසියේ ඇති වූ අවශ්‍යතා අනුව මිලදී ගැනීම් කරන ලදී. |
| **1.4.3 අභ්‍යන්තර විගණනය**<br>ආරම්භයේ සිට මේ දක්වාම අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන තනතුරක් නොමැත. |
| **1.4.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**<br>විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි. | ජනාධිපති කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා කළමනාකරණ විගණන කමිටුවට පත්කර ඇති අතර ජනාධිපති ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන නිලධාරියෙකු මගින් මෙම කොමිෂන් සභාවේ විගණනය සිදු කරගැනීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත ලිඛිත ඉල්ලීමක් කර ඇත. |
| **1.5 වත්කම් කළමනාකරණය**<br>-------------------------- | |
| **1.5.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**<br>2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු පාවිච්චි කළ නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. | 2014.07.17 දින අවසන් කර ඇත. |

**1.6 අනුකූල නොවීම**

**නීති රීති රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

| මුදල් රෙගුලාසි අංකය | වටිනාකම | අනුකූල නොවීම | |
|---|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 137 | 19,000 | ගෙවීම් වවුචර් 02 අනුමත නොකර ගෙවා තිබුණි. | ගෙවීම් කර ඇත්තේ අනුමැතියෙන් තොරව නොවේ. අනුමැතිය සඳහන්ව ඇත්තේ අදාල වවුවර දෙකට අමුණා ඇති සටහන් වලයි. සටහනේ ඇති අනුමැතිය පාදක කර ගෙන ඇති ගෙවීම් රු 5,000.00 හා රු 14,000.00 ක් පමණි. |
| (ආ) මුදල් රෙගුලාසි 138 හා 245 (i) | 176, 536 | සෑම වවුවරයක්ම සහතික කරන නිලධාරීන් විසින් සහතික කළ යුතු වුවත්, ගෙවීම්වවුචර් 08 ක් සහතික නොකර ගෙවීම් කර තිබුණි. | අතපසු වීමකි. ඉදිරියේදී මෙවන් ගැටළු ඇති නොවීමට විධි විධාන සලස්වා ඇත. |
| (ඇ) මුදල් රෙගුලාසි 237(ආ) | 65,036 | මිලදී ගත් ගබඩා භාණ්ඩ ලැබී ඇති බවට සහ ඒවා තොග පොතෙහි ඇතුළත් කළ බවට සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. | |
| (ඈ) මුදල් රෙගුලාසි 262 (2) | 322,120 | ගෙවීම් වවුචර් 05 ක " ගෙවන ලදී " මුද්‍රාව තබා නොතිබුණි. | |
| (ඉ) මුදල් රෙගුලාසි 262(3) | 218,817 | ගෙවීම් වවුචර් 09 ක මුද්‍රාව මත ගෙවූ දිනය හා අත්සන සටහන් කර නොතිබුණි. | |
| (ඊ) මුදල් රෙගුලාසි 454 | | 2013 ජනවාරි සිට ජූලි දක්වා වූ පාරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම හා නිකුත් කිරීම ලේඛනගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙවන් ගැටළු ඇති නොවීමට විධි විධාන සලස්වා ඇත. |
| (උ) මුදල් රෙගුලාසි 715 (3) | | තොග පොත් අධීක්ෂණය කර නොතිබුණි. | විගණන දෙපාර්තමේන්තුවේ මග පෙන්වීම අනුව තොග පොත් අධීක්ෂණය මේ වන විට සිදුකෙරේ. |
| (ඌ) මුදල් රෙගුලාසි 753 (1) (2) | | භාණ්ඩ ලැබීමේදී හා නිකුත් කිරීමේදි භාණ්ඩ ලැබීම් ඇනවුම් පත් හා නිකුත් කිරීමේ ඇනවුම් පත් භාවිතා කර නොතිබුණි. | |
| (එ) මුදල් රෙගුලාසි 754 | | ලිපිද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය තොග පොත්, 2013දෙසැම්බර් 31 දිනට තුළනය කර නොතිබුණු අතර තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | |
| (ඒ) මුදල් රෙගුලාසි 772 | | 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 42 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 772 අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන මු.රෙ 772 අනුව මේ වන විට ක්‍රියාකර ඇත.<br>පරිපාලන නිලධාරී මහතා විශ්‍රාම යාමත්, වැඩසටහන් නිලධාරී(මූල්‍ය) ප්‍රසූති නිවාඩු ලබා සිටීමත්, කාර්ය මණ්ඩලයේ ඌනතාවයන් නිසා ක්‍රමාණුකූල වැඩ බෙදීමක් සිදු කිරීමට නොහැකි විය. දැනට එම පුරප්පාඩු පුරවා ඇති බැවින් ඉදිරියේදී ඇතිවිය හැකි මෙවන් ගැටළු බොහෝ දුරට වලක්වා ගත හැකිවේ. |

| | |
|---|---|
| **1.7 කාර්ය සාධනය**<br>**-----------------**<br>2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ. | |
| **(අ) මුළුමනින් ඉටු නොකළ කාර්යයන්** | |
| (i) අනු ක්‍රියාකාරකම් 1 - සංවර්ධන යාන්ත්‍රණය සඳහා සේවා උපදේශකවරු මාර්ගයෙන් පාසල් වලින් තොරතුරු එකතු කර ගැනීම. (Develop mechanism for collecting information from school system through in service advisers) | ශ්‍රී ලංකාවේ පවතින පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පාසල් 9875 අදාළව මෙම කාර්ය කල යුතුය. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවෙහි පවත්නා මානව හා භෞතික සම්පත් සීමාව තුළ කෙටි කලකදී මෙම කාර්යය අවසන් කළ නොහැක. බස්නාහිර පලාතේ 3 වන වර්ගයේ (Type 3) පාසල් වලට අදාළව දත්ත රැස් කිරීම පමණක් 2013 වර්ෂයේ දී අවසන් කර ඇත. |
| (ii) අනු ක්‍රියාකාරකම් 2 - ජාතික විශ්ව විද්‍යාල සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම. (Preparation of Policy proposals for development of national universities) | මෙම කාර්ය අවසන් කල යුත්තේ දීර්ඝ උපදේශන ක්‍රියාවලියක් ඔස්සේය. තෝරාගත් විශ්ව විද්‍යාල කිහිපයකම කළ ක්ෂේත්‍ර චාරිකා වල දී උසස් අධ්‍යාපන විෂය පථය භාර උප කමිටු (Sub Committee on Higher Education) සාමාජිකයින් සහභාගී වූ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා මගින් ක්‍රියාවලිය ආරම්භ කිරීම පමණක් 2013 වර්ෂයේ දී සිදුවිය. මේ වන විට ක්‍රියාවලියේ ඊළඟ පියවර ක්‍රියාත්මක වෙමින් පවතියි. |
| **(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ කාර්යයන්** | |
| (i) අනු ක්‍රියාකාරකම් 2 - කුඩා පාසල් සංශෝධණය කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම. (Preparation of policy proposals and strategy for development of small schools) 2012 වර්ෂයේ සිටම ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ පළාත් 09 න්ම තෝරාගත් පාසල් වලින් තොරතුරු එකතු කර කුඩා පාසල් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීමට සැලසුම්කර තිබූ නමුත් බස්නාහිර පළාත් පාසල්වලින් තොරතුරු එකතු කර ගැනීම හැර වෙනත් කාර්යයක් සිදු කර නොතිබුණි. | පැවති සීමිත මානව හා වෙනත් භෞතික සම්පත් අනුව 2013 වර්ෂයේ දී ව්‍යාපෘතිය බස්නාහිර පලාතේ කුඩා පාසල් වලට සීමා කිරීමට සිදුවිය. 2014 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය තවත් පලාත් 4ක් ආවරණය කිරීම දක්වා විස්තාරණය කර ඇත. දත්ත රැස් කිරීමට සමගාමීව දත්ත විශ්ලේෂණය සිදු කරමින් පවතී. |
| (ii) අනු ක්‍රියාකාරකම් 4 - අධ්‍යාපන පද්ධතිය, කාර්යාල තුළ සිංහල භාෂාව භාවිතය සඳහා සන්නිවේදනය සහ මුද්‍රිත මාධ්‍ය ප්‍රමිත සකස් කිරීම. ( Preparation of standards communication and the printed media for Sinhala language usage in education system, official) අදාල පාර්ශවයන්ගෙන් තොරතුරු එකතු කර, වාර්තාව සකස්කර තෝරාගත් පාසල් වෙත බෙදාහැර, මත විමසුම් ලබාගෙන ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීමට සැලසුම්කර තිබූ නමුත් සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය පිළිබඳ සාකච්ඡා වාර දෙකක් පැවැත්වීම හැර වෙනත් කාර්යයක් සිදුකර නොතිබුණි. | විවිධ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පැවති සාකච්ඡා වලදී අනාවරණ වූ කරුණු අනුව ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කළ යුතු විය. ඒ අනුව මේ වන විට ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

**(ඇ) සැලසුම් කිරීම**

(i) 2013 – 2016 වර්ෂ අතර කාලය සඳහා වූ සංයුක්ත සැලැස්ම, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබූ අතර ඒ ඒ වර්ෂයන් සඳහා ඒ ඒ කාර්යයනට අදාළ ඇස්තමේන්තුගත වියදම්ද ඒ ඒ කාර්යයන් සඳහා භෞතික ඉලක්කයන්ද එම සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තියේ උපදෙස් අනුව සංයුක්ත සැලැස්මට, කොමිෂන් සභාවේ පවතින භෞතික සම්පත් හා පෙර වර්ෂ 3 ක මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනයද ඇතුළත් කර නොතිබුණි.

2014 වර්ෂය තුල දී මෙම අඩුපාඩු මග හැරවීමට උචිත කටයුතු කරමින් පවතී.

**1.8 අවිධිමත් ගණුදෙණු**

(අ) තාක්ෂණික ඇගයීමකින් තොරව පිළිවෙලින් රු.152,040 ක් සහ රු. 291,200 ක් ගෙවා යතුරුපැදියක් සහ ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදීගෙන තිබුණි.

**(අ) යතුරු පැදියක් මිලදී ගැනීම**

ප්‍රසම්පාදන කමිටු සභාපතිවරයා වන ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා යාන්ත්‍රික ඉංජිනේරු විෂයය පිළිබඳ මහාචාර්යවරයෙකි. ඒ අනුව අවශ්‍ය තාක්ෂණික ඇගයීම සිදු වී තිබේ.

**ඡායා පිටපත් යන්ත්‍රය මිලදී ගැනීම**

වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකරණ අමාත්‍යාංශයේ වරලත් ඉංජිනේරුවෙකු විසින් විශේෂඥ උපදෙස් ලබා දී ඇත.

(ආ) රු. 335,450 ක් ගෙවා වර්ග 08 කට අයත් කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 (ඇ) ඡේදයේ උපදෙස් වලින් බැහැරව පිරිවිතරද ලබානොදී සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණි.

(ආ) අවසන් මොහොතේ ලද අක් මුදල් ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අධීක්ෂණය යටතේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට අනුව මිල දී ගැනීම් කර ඇත. ප්‍රසම්පාදන කමිටුව සහේතුක ව ලබා දී ඇති අනුමැතියට අනුව කටයුතු කර තිබේ.

(ඇ) හදිසි අවශ්‍යතාවයන් සේ සලකා ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින්ද තාක්ෂණික ඇගයීමකින්ද තොරව රු 386,500 ක් ගෙවා ජංගම පරිගණක 03 ක් සහ එම්එස් වින්ඩෝස් ඔෆිස් පැකේජ 05 ක් මිලදීගෙන තිබුණි.

(ඇ) ජංගම පරිඝණක භාවිතා කරන නිලධාරීන් විසින් ලබා දී ඇති පිරිවිතර ප්‍රසම්පාදන කමිටුව විසින් පිළිගන්නා ලදුව විධිමත් පරිදි මිල දී ගැනීම සිදු කර ඇත. ජංගම පරිඝණක ඉන්වෙන්ට්‍රිගත කර ඇත. සභාපතිතුමා වෙත නිකුත් කළ පරිගණකය වෙනුවෙන් නිකුත් කිරීමේ පත්‍රිකාව ගොණුවේ ඇත. නිකුත් කළ බව ඉන්වොයිසියේ දැක්වේ. ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් මිලදී ගැනීම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දී තිබේ.

**1.9 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) තෘතියක මට්ටම | 11 | 04 | 07 |
| (iii) ද්විතියක මට්ටම | 10 | 09 | 01 |
| (iv) ප්‍රාථමික මටටම | 12 | 12 | - |
| | 36 | 28 | 08 |

සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු 08 ක් පුරප්පාඩුව පැවතුණි.

**(අ) මානව සම්පත් කළමනාකරණය**

බඳවා ගැනීම් සිදු කර පුරප්පාඩු සංඛ්‍යාව 03ක් දක්වා අඩුකර ඇත. එම පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගැනෙමින් පවතියි.